# ගෝලීය දම්වැලේ රුසියානු පුරුක

'ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය පරාජය කිරීමට තම පූර්ණ සහයෝගය ලබාදෙන බව'ට රුසියානු ෆෙඩරේෂනය ප්‍රතිඥා දී ඇතැයි ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවිය ඔක්තෝබර් 19 වෙනිදා වාර්තා කළේය. ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ නායකත්වයෙන් නොබෝදා රුසියාවේ විශේෂ සංචාරයක යෙදුණු ශ්‍රී ලංකා ආරක්ෂක දූත පිරිස හමු වූ රුසියානු රාජ්‍ය බලධාරීන් එකී ප්‍රතිඥාව දුන් බව වාර්තාවේ දක්වේ. ඉන්දියාවේ සිට චීනය, පකිස්ථානය සහ ඉරානය දක්වාත්, ඊශ්‍රායලයේ සිට එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය ප්‍රමුඛ අවශේෂ නේටෝ සාමාජික බටහිර සහ නැගෙනහිර යුරෝපීය රාජ්‍යයන් දක්වාත් පැතිර යන 'ඊළමට එරෙහි ජගත් සන්ධානයේ' ස්වරූපය පිළිබඳව මීට පෙර ලිපි මගින් සාකච්ඡා කොට තිබේ. දෙන ලදැයි කියන රුසියානු ප්‍රතිඥාව විසින් පරිපූර්ණත්වයට පත් කරන්නේ එකී ගෝලීය හවුලයි.

රුසියානු - ශ්‍රී ලංකා යුද සබඳතා විශේෂයෙන්ම දෙවෙනි ඊළම් යුද්ධයෙන් පසුකාලීනව වර්ධනය වූවකි. පළමු ඊළම් යුද්ධය ඇවිළ ගිය නිරවි යුද සමය තුළ දෙමළ ගරිල්ලා ව්‍යාපාරයට එරෙහි ශ්‍රී ලංකා රාජ්‍යයේ ප්‍රධානතම අනුග්‍රාහකයන් වූයේ එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ඊශ්‍රායලය සහ පකිස්ථානයෙන් සැදුම්ලත් සෝවියට් විරෝධී කඳවුරයි. එම පසුබිම තුළ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සිවිල් යුද්ධය පිළිබඳ වෙනස් දෘෂ්ටි කෝණයකින් බැලීමට සෝවියට් සංගමය පොළඹවා ලූ හේතු ගණනාවක් තිබිණ. එක් අතකින් දෙමළ ගරිල්ලා කණ්ඩායම් සම්බන්ධයෙන් සෝවියට් හිතවාදී ඉන්දියාව විසින් අනුගමනය කළා වූ අනුග්‍රහශීලී පිළිවෙත ඊට බලපෑවේය. අනෙක් අතින් ජයවර්ධන පාලන තන්ත්‍රයේ විවෘත ඇමරිකානු හිතවාදී විදේශ පිළිවෙත ඊට බලපෑවේය. නිදසුනක් වශයෙන්, දකුණු ආසියාතික කලාපයේ භූ දේශපාලනික බල තුලනය වෙනස් කළ ඓතිහාසික හැරුම් ලක්ෂ්‍යයක් සේ සැළකුණු 1979■සෝවියට් රතු හමුදා ඇෆ්ඝනිස්ථානයට ඇතුල්වීම සම්බන්ධයෙන් ඉන්දියාවේ ස්ථාවරය වඩා මෘදු එකක් විණ. 'කිසිදු රටක් විසින් තවත් රටක් ආක්‍රමණය කිරීම සාධාරණීකරණය කළ නොහැකි බව' 1980දී බලයට පත් සැණින් ඉන්දිරා ගාන්ධි අගමැතිවරිය ප්‍රකාශ කළ ද, 1980 පෙබරවාරියේදී සෝවියට් විදේශ අමාත්‍ය අන්ද්‍රේ ග්‍රොමිකෝගේ ඉන්දීය සංචාරයට සමාන්තරව නිකුත් කළ ඉන්දු-සෝවියට් ඒකාබද්ධ නිවේදනය ඇෆ්ඝනිස්ථාන අර්බුදය සම්බන්ධයෙන් නිහඬ පිළිවෙතක් රැකීය. නමුත් එක්සත් ජනපද හිතවාදී විදෙස් පිළිවෙත අනුව යමින් ශ්‍රී ලංකාව පිහිටා සිටියේ සෝවියට් මැදිහත්වීම විවෘතව හෙළා දැකීමේ ස්ථාවරයක ය.

අනෙක් අතින් 1951දී අත්සන් කළ 'ඇමරිකානු හඬ' සම්බන්ධයෙන් නව සංශෝධිත ගිවිසුමකට එළඹීමට 1983දී ශ්‍රී ලංකාව ගන්නා ලද තීරණය ඉන්දියාවේ පමණක් නොව, සෝවියට් සංගමයේද බලවත් කණස්සල්ලට හේතු විය. නව සංශෝධිත ගිවිසුමට අනුව එක්සත් ජනපද ප්‍රවෘත්ති ඒජන්සියට අක්කර 1000ක (පසුව අක්කර 500ක) භූමි භාගයක් ලබාදීමට එකඟතාව පළ කෙරුණු අතර ග්‍රාහක සහ සම්ප්‍රේෂණ පහසුකම් සහිත විකාශන මධ්‍යස්ථානයේ කෙටි තරංග සම්ප්‍රේෂණ කුළුණු 06ක් අලුතින් ඉදි කෙරිණ. 1985 මාර්තු 03 වෙනිදා මේ සම්බන්ධයෙන් පළ වූ සෝවියට් 'ටාස්' ප්‍රවෘත්ති වාර්තාවක් විසින් ශ්‍රී ලංකාවේ භූමිකාව කෙරෙහි වූ සෝවියට් සැක සංකාවන් විවෘත තලයේදී ප්‍රකාශයට පත් කෙරිණ: ''සමාජවාදී සහ සංවර්ධනය වෙන රටවලට එරෙහි එක්සත් ජනපද මානසික යුද මෙහෙයුම්වලට අවශ්‍ය නව ශාඛාවක් වන ගුවන් විදුලි මධ්‍යස්ථානයක් ගොඩනැංවීම මගින් වෙනත් රටවල අභ්‍යන්තර කටයුතුවලට මැදිහත්වීමේ එක්සත් ජනපද ක්‍රියාමාර්ග උත්සන්න කර ඇති බව පෙන්නුම් කරයි. අදාළ මධ්‍යස්ථානය ප්‍රධාන වශයෙන් දකුණු සහ නිරිත දිග ආසියාතික රටවල් ඉලක්ක කොට, සියල්ලටමත් වඩා එක්සත් ජනපද පාලක කවයන්ගේ අවශ්‍යතාවන්ට ප්‍රතිවිරුද්ධ ස්වාධීන විදේශ පිළිවෙතක් සහිත ඉන්දියාවටත්, ඇෆ්ඝනිස්ථානයටත් එරෙහිව ක්‍රියාත්මක කෙරෙනු ඇතැයි නිරීක්ෂකයෝ පෙන්වා දෙති.'' *(Strategic Significance of Sri Lanka - Ramesh Somasundaram / 138 පිටුව)*

දෙවෙනි ඊළම් යුද්ධය ඇරඹුණේ 1990 ජූනි මාසයේදී ය. සෝවියට් සංගමය බිඳ වැටීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වූයේ 1991 දෙසැම්බරයේදී ය. රුසියාව ප්‍රමුඛ පැරණි සෝවියට් සංගමයේ සාමාජික රාජ්‍යයන් හා පොදු වශයෙන් වෝර්සෝ කඳවුරට අයත්ව තිබූ නැගෙනහිර යුරෝපීය රාජ්‍යයන් ශ්‍රී ලංකාවේ ඊළම් යුද්ධයේ අවි සැපයුම්කාර රාජ්‍යයන්ගේ නව භූමිකාව භාරගත්තේ ඉන් අනතුරුව ය.

### 'නව රුසියාවේ' අවි හරඹ

ආසන්න වශයෙන් සැළකූ කල පැරණි සෝවියට් සංගමයේ දළ ජාතික නිෂ්පාදිතයෙන් 20%ක්ද, කාර්මික ශ්‍රම බලකායෙන් 15%ක්ද කැපවූයේ යුද්ධෝපකරණ කර්මාන්තය සඳහා ය. නමුත් නිෂ්පාදිතයෙන් අති මහත් බහුතරයක් සෝවියට් හමුදා බලය වර්ධනය කිරීම පිණිස කැප වුණි. සෝවියට් සංගමය බෙදී විසිරී යාමෙන් පසු සෝවියට් යුද කර්මාන්ත සංකීර්ණයේ වැදගත්ම පංගුව හිමි වූයේ රුසියානු ෆෙඩරේෂනයට ය. නව රුසියානු රාජ්‍යයේ ආරක්ෂණ කර්මාන්ත ක්ෂේත්‍රයේ සැළසුම්, පර්යේෂණ සහ නිෂ්පාදන වැඩ බිම් 1,500කට ආසන්න ප්‍රමාණයක් තුළ මිලියන 9කට ආසන්න ශ්‍රම බලකායක් මුලින් සේවයේ නියුක්තව සිටි අතර, 1997 වන විට මෙම ප්‍රමාණය මිලියන 2.5කට පහත බැස්සේය. වැඩිවන උද්ධමනය හමුවේ අවශේෂ සේවක පිරිස් එක්කෝ රුසියානු පෞද්ගලික අංශය විසින් උරාගනු ලැබිණ. නැතහොත් බටහිර නිෂ්පාදන සමාගම් තුළට ගාල් වී තිබිණ.

නමුත් 2000න් පසු වකවානුව තුළ රුසියානු යුද අවි කර්මාන්තය සාපේක්ෂ ස්ථාවරත්වයක් පෙන්නුම් කරන්නට සමත් විය. 2003 වසරේදී සංතෘප්ත කළ රුසියානු යුද අවි ඇණවුම්වල වටිනාකම ඩොලර් බිලියන 4.3ක් වූ අතර, 2004දී එය බිලියන 6ක් දක්වාද, 2005දී බිලියන 6.12ක් දක්වාද ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරන ලදී. පශ්චාත් සෝවියට් වකවානුව තුළ වඩාත් සාර්ථකම වසර සේ ගැණුනු 2006දී සංතෘප්ත කළ රුසියානු යුද අවි ඇණවුම්වල වටිනාකම ඩොලර් බිලියන 6.4 දක්වා ඉහළ ගියේය. සාම්ප්‍රදායිකව විශාලතම ගැණුම්කරුවන් සේ සැළකුණු ඉන්දියාව සහ චීනයට ඔබ්බෙන් වූ නව ගැණුම්කාර රාජ්‍යයන් සෙවීමේ ප්‍රයත්නයට '90 අග භාගයේ සිටම රුසියාව විසින් ප්‍රමුඛත්වය ලබා දෙන ලදී. 2006 මාර්තුවේදී ජනාධිපති පුටින්ගේ ඇල්ජීරියානු සංචාරයෙන් පසු ඇල්ජීරියාව සමග අත්සන් කරන ලද ඩොලර් බිලියන 7.5ක් වටිනා වාර්තාගත යුද අවි සැපයුම් කොන්ත්‍රාත් ගිවිසුමද, එම වසරේම ජූනි මාසයේ හුගෝ චාවේස්ගේ රුසියානු සංචාරයෙන් පසු වෙනිසියුලාව සමග අත්සන් තබන ලද ඩොලර් බිලියන 3ක යුද අවි සැපයුම් ගිවිසුමද ඉහත ප්‍රයත්නයේ ප්‍රතිඵල විය. රුසියාව විසින් 2006දී අත්සන් තබන ලද සමස්ත සැපයුම් කොන්ත්‍රාත් ගිවිසුම්වල වටිනාකම ඩොලර් බිලියන 14ක් වූ අතර ඉන් 64%ක වෙළෙඳපොළ පංගුවක් අයත් වූයේ රජයට අයත් ප්‍රධාන අවි අපනයන ව්‍යවසාය වන *'Rosoboronoexport'* සමාගමට ය. *(Russia on the Arms Market in 2006 - Konstantin Makiento / Dimitry Vasiliev).*

සිය යුද්ධෝපකරණ සඳහා සාපේක්ෂව කුඩා මුත් ස්ථාවර ගැණුම්කාර විභවයක් සහිත රාජ්‍යයක් වශයෙන් දිගුකාලීන සිවිල් යුද්ධයක් ඇවිළ යන ශ්‍රී ලංකාව හඳුනා ගැනෙන්නේ මේ පශ්චාත් සෝවියට් සමයෙහි ය. 'අවි වෙළඳාමේ දෘෂ්ටි කෝණයෙන් වඩාත්ම බලාපොරොත්තු රඳවිය හැකි රාජ්‍යයන් අතරට මලයාසියාව, සිංගප්පූරුව, ඉන්දුනීසියාව මෙන්ම ශ්‍රී ලංකාවද ඇතුළත්ව ඇතැ'යි රුසියානු අවි අපනයනයන්ට අදාළ මුල් රාජ්‍යායතනය වශයෙන් සැළකුණු *Rosvooruzhenie* හි නියෝජ්‍ය අධ්‍යක්ෂ අලෙක්සේයි රොෂ්චින් විසින් 1999 නොවැම්බරයේදී කරන ලද ප්‍රකාශයට පදනම් වූ හේතු සැඟව තිබුණේ රුසියාව තුළ වර්ධනය වූ මේ නව ආකල්ප තුළ ය. *(From Adversaries to Partners: Chinese & Russian Military Cooperation after the Cold War - Ming Yen Tsai / 135 පිටුව)* අවි අපනයනය සම්බන්ධයෙන් අනුගමනය කළ පැරණි සෝවියට් දේශපාලන සහ සදාචාර පිළිවෙත්වලින් බැහැර වූ නව රුසියාවේ දෘෂ්ටි කෝණයෙන් බැලූ විට ඇත්ත වශයෙන්ම නොනවතින සිවිල් යුද්ධයකට ගොදුරු වූ ශ්‍රී ලංකාව වඩා ශක්තිමත් අවි වෙළඳපොළක විභවය පෙන්නුම් කළ බවට සැක නැත.

සාම්ප්‍රදායික යුද්ධායුද සහ බර අවි අපනයනයේදී අවශේෂ අවි සැපයුම්කාර රාජ්‍යයන් ඉක්මවා, පෙරමුණ රුසියාවට ලැබිණ. නිදසුනක් ලෙස 1992 සිට 2007 දක්වා රුසියාව විසින් සෙසු සැපයුම්කරුවන් අභිභවා ශ්‍රී ලංකාවට සපයන ලද හමුදා සන්නද්ධ රථ සංඛ්‍යාව 50කට ආසන්න වේ. මේ යටතේ *BTR* 80 වර්ගයේ සන්නද්ධ රථ 30ක් 1998දී සපයන ලද අතර, 2001 වසරේදී *BTR 80 A* වර්ගයේ සන්නද්ධ රථ 19ක් ශ්‍රී ලංකාවට සපයනු ලැබිණ. *(Export Deliveries of Armoured Vehicles from Russian Plants 1992 - 2007 / Moscow Defense Brief - 2008 - 1)* නමුත් 2001 වසර සඳහා වූ සාම්ප්‍රදායික අවි සැපයුම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ වාර්ෂික ලේඛණයට රුසියානු ෆෙඩරේෂනය විසින් ඉදිරිපත් කොට ඇති මීට පරස්පර සංඛ්‍යා ලේඛණයන්ට අනුව බලතොත් එම වසරේදී පමණක් රුසියාව විසින් ශ්‍රී ලංකාවට සපයා ඇති සන්නද්ධ රථ සංඛ්‍යාව 55කි. *(UN Register of Conventional Arms Transfers - 2001 / Register Database 1992-2002)*

**ඊළම් යුද්ධයේ රුසියානු පංගුව**

සිව්වෙනි ඊළම් යුද්ධය විසින් වේගවත් කරනු ලැබ ඇත්තේ මෙකී අතීත යුද සබඳතාවලින් ප්‍රකාශිත ද්වීපාර්ශ්වික ක්‍රියාකාරීත්වයයි.

රාජපක්ෂ ආණ්ඩුව බලයට පත්වීමෙන් මාස කිහිපයක් ඇතුළත නව විදේශ ඇමතිවරයා රුසියාවේද, රුසියානු ෆෙඩරේෂනයේ වෙළඳ සහ ආර්ථික සංවර්ධන ඇමතිවරයාද ශ්‍රී ලංකාවේද චාරිකාවන්හි යෙදෙමින් ද්වීපාර්ශ්වික සාකච්ඡා පැවැත්වූහ. 2006 මාර්තුවේදී මොස්කව් පාලනයේ ජාත්‍යන්තර සබඳතා අංශයෙහි ප්‍රධානියාගේ මූලිකත්වයෙන් යුතු විශේෂ දූත පිරිසක් ශ්‍රී ලංකා බලධාරීන් හමු වී සාකච්ඡා කළ අතර ආරක්ෂක ක්ෂේත්‍රයේ වැදගත් සබඳතාවන් අලුත් වටයකින් වර්ධනය වීම ඇරඹුණේ සිව් වෙනි ඊළම් යුද්ධයේ පුපුරා යාමත් සමගිනි. විශේෂයෙන්ම ඊළම් යුද ඉතිහාසය තුළ ගුවන් බලය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය දරූ ඒකාධිකාරය දෙමළ ගරිල්ලන් වර්ධනය කළ ගරිල්ලා ගුවන් බලය විසින් අභියෝගයට ලක් කිරීම හමුවේ රජයේ ගුවන් ප්‍රහාරක හැකියාවන් වැඩි දියුණු කිරීම හදිසි සහ වැදගත් කාර්යයක් සේ සැළකිණ. 2007 දෙසැම්බරයේදී ශ්‍රී ලංකා ආරක්ෂක බලධාරීන් හමු වූ විශේෂ රුසියානු ආරක්ෂක දූත පිරිසක් නව යුදමය අවශ්‍යතා පිළිබඳව සාකච්ඡා කළහ. දෙසැම්බර් 17 වෙනිදා සිදුවූ මේ හමුවේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු *Mi-35* ප්‍රහාරක හෙලිකොප්ටර් උත්ශ්‍රේණිකරණයට අමතරව, රුසියාවේ නිෂ්පාදිත නව අවි තොග ලබාගැනීම සම්බන්ධයෙන්ද සාකච්ඡා කෙරිණ. කර්නල් ජෙනරාල් ව්ලැදිමීර් මොල්ටෙන්ස්කෝයිගේ නායකත්වයෙන් යුතු රුසියානු ආරක්ෂක නියෝජිත පිරිස ආරක්ෂක ලේකම්වරයා මෙන්ම යුද හමුදාපතිවරයා සහ ගුවන් හමුදාපතිවරයාද හමු වී සාකච්ඡා කළහ. නිල සාකච්ඡාවන්ට අමතරව රුසියානු නියෝජිත පිරිස, දිවයිනේ වැදගත් යුදමය කඳවුරු කිහිපයකද නිරීක්ෂණ චාරිකාවන්හි නියැලීම ස්ථාවර ආරක්ෂක සබඳතාවන්ට මුල පිරීමේ නිමිත්තක් සේ සළකනු ලැබිණ. *(Military aid: US out, enter Russia - www.lankanewspapers.com / 23.12.2007)* වත්මන් රුසියානු පාබල හමුදාවන්ගේ සහකාර ආඥාපතිවරයා වශයෙන් කටයුතු කරන මොල්ටෙන්ස්කෝයි, දෙවෙනි චෙච්නියානු යුද්ධයේදී රුසියානු හමුදාවන්ගේ ඒකාබද්ධ මෙහෙයුම් ආඥාපතිවරයාව සිටි කර්නල් ජෙනරාල් වැලරි බරනෝෆ්ගේ අනුප්‍රාප්තිකයා වශයෙන්ද කටයුතු කළ කෘතහස්ත හමුදා සෙන්පතියෙකු වශයෙන් සැළකේ.

නමුත් වඩාත් වැදගත් යුද අවි ගණුදෙනුවකට ශ්‍රී ලංකාව සහ රුසියාව යොමුවූයේ ගුවන් හමුදාවේ ප්‍රහාරක බලය ඉහළ නැංවීම අරමුණු කොටගත් මිග් 29 ප්‍රහාරක ජෙට් යානා මිලට ගැනීමේදී ය. දෙමළ ගරිල්ලන් විසින් භාවිතාවට ගනු ලබන සතුරු ගුවන් යානාවන්ට ගුවනේදී ප්‍රහාර එල්ල කිරීමේ සමත් අන්තර් ප්‍රතිග්‍රාහක හැකියාවන් සහිත මිග් 29 යානා 5ක් එකක් ඩොලර් මිලියන 15කට නොඅඩු මුදලකට මිල දී ගැනීම සම්බන්ධයෙන් දෙපාර්ශ්වය අතර සාකච්ඡා පැවැත්වෙන බවට මුල් වරට වාර්තා වූයේ ඉකුත් වසරේ මැයි මාසයේදී ය. *(Sri Lanka to acquire Russian Mig 29 Fighter Jets - www.india-defence.com / 07.05.2007)* නමුත් මිග් යානා මිලට ගැනීමේ තීරණය ගුවන් හමුදාවේ සමස්ත ගුවන් සංග්‍රාමික හැකියාව නංවාලීමේ අරමුණින් මිස, කොටි ගුවන් යානාවන්ට මුහුණ දීමේ සරළ අවශ්‍යතාව මත ගනු ලැබූ තීරණයක් නොවන බව ජනාධිපතිවරයා 2007 මැයි 16 වෙනිදා අරලිය ගහ මන්දිරයේදී පැවැති මාධ්‍ය ප්‍රධානීන්ගේ සාකච්ඡාවකදී ප්‍රකාශ කොට තිබිණ. අවශ්‍යතාව කවරක් වුවද, අවි ගණුදෙනුව පිළිබඳ ද්වීපාර්ශ්වික සාකච්ඡාවන් ඉක්මණින් සඵල වන ලකුණු පෙන් වූ අතර 2008 මාර්තු 13 වෙනිදා 'ජේන්ස් ඩිෆෙන්ස් වීක්ලි' සඟරාව ශ්‍රී ලංකා රජයට අයත් ලංකා ලොජිස්ටික්ස් සමාගමේ ප්‍රධානී රන්ජිත් වික්‍රමසිංහ උපුටා දක්වමින් වාර්තා කොට තිබුණේ 'මිග් 29*SM* ප්‍රහාරක යානා හතරක් සහ මිග් - 29*UB* වර්ගයේ ආසන දෙකේ යානාවක් මිලදී ගැනීමට අදාළ සාකච්ඡා සාර්ථකව පැවැත්වෙන බව'කි. අදාළ යානා මේ වසරේ සැප්තැම්බරයේ දී ශ්‍රී ලංකාවට ළඟා වූ බව ඇතැම් අන්තර්ජාල වෙබ් අඩවි මැත දී වාර්තා විසින් වාර්තා කර තිබිණ.

**යුක්රේන භූමිකාව**

තමන් විසින් කරනු ලබන සෘජු යුද අවි සැපයුම්වලට අමතරව පැරණි සෝවියට් සංගමයට අයත් සමූහාණ්ඩු වශයෙන් තිබී පසුකාලීනව ස්වාධීන වූ රාජ්‍යයන් විසින් සපයනු ලබන යුද්ධෝපකරණ සඳහා අවශ්‍ය නඩත්තු සේවා සැපයීමද රුසියාව විසින් කරනු ලබයි. ඔක්තෝබර් 22 වෙනිදා 'ඩේලි මිරර්' පුවත්පතේ පළ වූ වාර්තාවකට අනුව ශ්‍රී ලංකා ආරක්ෂක දූත පිරිසේ මෑත සංචාරයේ ප්‍රතිඵලයක් ලෙස පැරණි සෝවියට් සංගමයේ කොටස්කාරයින්ව සිටි රාජ්‍යයන් විසින් සපයන ලද යුදමය උපකරණ සඳහා අවශ්‍ය අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු කිරීමට රුසියාව දැනටමත් එකඟතාව පළ කොට තිබේ.

මෙයින් හෙළිවන්නේ රුසියානු ෆෙඩරේෂනය හැරුණු විට පැරණි සෝවියට් සංගමයට අයත්ව තිබූ වෙනත් රාජ්‍යයන් විසින්ද ශ්‍රී ලංකා රජයට අවශ්‍ය යුද අවි ස්ථාවරව සපයනු ලැබීමේ යථාර්ථයයි. නිදසුන් ලෙස තුන්වෙනි ඊළම් යුද්ධය ඇරඹුණු 1995දී ඇන්ටනෝව් 24 වර්ගයේ යුදමය ප්‍රවාහන යානා 4කට අදාළ සැපයුම් කොන්ත්‍රාත් ගිවිසුමක් ශ්‍රී ලංකා රජය සහ කසාක්ස්ථානය අතර

අත්සන් තැබුණු අතර 1996දී අදාළ යානා ශ්‍රී ලංකාවට සපයනු ලැබිණ. යානා හැසිරවීම සඳහා අවශ්‍ය කසාක් තාක්ෂණඥයින්ද ගිවිසුම් ප්‍රකාරව සැපයිණ. *(Kasakhstan's Military Technical Cooperationwith Foreign Statets - Marat Kenzhetaev / Moscow Defense Brief - 2002 - 1)*

නමුත් පැරණි සෝවියට් සංගමයට අයත්ව තිබූ සමූහාණ්ඩු අතරින් වඩාත් උද්‍යෝගීමත් යුද සැපයුම්කාරක භූමිකාව දැනටත් ඉටු කරනුයේ යුක්රේනය විසිනි. බිඳී වෙන්වී යාමේදී පැරණි සෝවියට් යුද කර්මාන්ත සංකීර්ණයෙන් තුනෙන් එකක පංගුවක් යුක්රේනයට හිමි වූ අතර සමස්ත යුක්රේන කර්මාන්ත ක්ෂේත්‍රයෙන් 70%ක් නියෝජනය වන්නේ එමගිනි. අතීත සෝවියට් සමූහාණ්ඩු බොහෝමයක් මෙන්ම යුක්රේනයද, පූර්ණ නිමි අවි නිෂ්පාදන චක්‍රයන්ට *(close-loop production cycles)* හිමිකම් නොකියන අතර ඒ හේතුවෙන් රුසියාවේ නිෂ්පාදිත අමතර කොටස් සහ අංගෝපාංග මත තව දුරටත් පරායත්තව හිඳියි. 2005 වන විට යුද අවි නිපැයුම් කර්මාන්තයෙහි නියැලෙමින් සිටි රුසියානු - යුක්රේන හවුල් නිෂ්පාදන සැකසුම් ප්‍රමාණය 1,330කට ආසන්න වූ අතර යුක්රේන ආරක්ෂණ ආනයනවලින් 22.8%ක පංගුවකට හිමිකම් කියන ලද්දේ රුසියාව විසිනි. රුසියානු - යුක්රේන ආරක්ෂණ කර්මාන්තයන්ගේ ඒකාබද්ධතාව කෙතරම් ගැඹුරින් මුල් බැසගත් එකක්ද යත්, 2005දී යුක්රේනය විසින් අලෙවි කරන ලද ඩොලර් මිලියන 680ක් වටිනා අවි තොග අතුරින් මිලියන 200කට ආසන්න පංගුවක් නියෝජනය කරන ලද්දේ රුසියානු යුක්රේන ඒකාබද්ධ නිෂ්පාදන විසිනි. *(Obituary for Ukranian defense industry - Yuri Zaitsev / RIA Novosti)*

ඉහත කාරණා වැදගත් වන්නේ රුසියානු - ශ්‍රී ලංකා ඍජු යුද සබඳතාවන්ට අමතරව යුක්රේනය වැනි රාජ්‍යයන් විසින් කරනු ලබන අවි සැපයුම් මගින් නිර්මාණය කරන වක්‍ර යුද සබඳතාවන්ට අදාළ පසුබිම වටහා ගැනීමේදී ය. ඉහත දෙරට අතර ආරක්ෂණ කර්මාන්තයන් අතර පවතින ඒකාබද්ධතාව එවැනි හවුල්කාරී අලෙවියෙන් පසු සේවාවන්ට මඟ පාදනු ලබයි. එතරම් පරිපූර්ණ මූලාශ්‍රයක් වශයෙන් සැළකිය නොහැකි වුවද, සාම්ප්‍රදායික අවි සැපයුම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ වාර්ෂික ලේඛණයන් විසින් පෙන්නුම් කරන්නේ යුක්රේනය ශ්‍රී ලංකාවට ස්ථාවර අවි සපයන්නෙක් වශයෙන් ක්‍රියා කොට ඇති බවයි. අදාළ ලේඛණයන්ට අනුව 1994දී ශ්‍රී ලංකා හමුදාවන්ට අවශ්‍ය සන්නද්ධ රථ 16ක් සපයා ඇති යුක්රේනය 1996දී *Mi-24B* හා *Mi-24R* වර්ගයේ ප්‍රහාරක හෙලිකොප්ටර් යානා 3ක් සපයා තිබේ. 1998 දී යළිත් *Mi-24B* වර්ගයේ හෙලිකොප්ටර් යානාවක් සැපයීමට අමතරව 2000දී මිග් - 27*M* ප්‍රහාරක යානා 6ක් සහ මිග් - 29*UB* ආසන දෙකේ යානාවක් සැපයූ යුක්රේනය, 2001දී *Mi-24* ප්‍රහාරක හෙලිකොප්ටර් යානා 4ක් ශ්‍රී ලංකා රජයේ හමුදාවන්ට සපයා තිබේ. *(Managing the Challenge of Illegal Arms Transfers - Leonid Polyakov / Defense Academy of the United Kingdom - May 2003 / 5-7 පිටු)* සාම්ප්‍රදායික අවි සැපයුම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2006 වසර සඳහා වූ වාර්ෂික ලේඛණයට පරිශිෂ්ටයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා විසින් 2007 සැප්තැම්බරයේදී ප්‍රකාශයට පත් කළ ලේඛණයට අනුව සිව් වෙනි ඊළම් යුද්ධය ඇවිළ ගිය 2006 වසරේදී මිග්-27 වර්ගයේ බෝම්බ ප්‍රහාරක ගුවන් යානා 4ක් ශ්‍රී ලංකාවට යුක්රේනය විසින් සපයා තිබේ. *(UN Register of Conventional Arms Transfers - 2006 / Addendum - 9-10 පිටු)*

**නව ලිට්මස් පරීක්ෂාවක්**

ඉහතින් සාකච්ඡා කළ රුසියානු ෆෙඩරේෂනය ප්‍රමුඛ පැරණි සෝවියට් සංගමය විසුණු කොට මතු වූ නව රාජ්‍ය පද්ධතියේ ක්‍රියාකාරකම් විසින් සම්පූර්ණ කරනුයේ දෙමළ ජාතික ව්‍යාපාරයට එරෙහි පැතිරුණු ගෝලීය සන්ධානයේ පරිසමාප්ත රූපකායයි. දෙමළ ගරිල්ලා ව්‍යාපාරයේ යුදමය බලය සීමා කොට තලා දැමීමට පිරිනැමෙන ඉහතින් කී ඍජු යුද ආධාර සැපයුම්වලට අමතරව එහි අන්තර්තර්ජාතික දේශපාලන සහ මූල්‍යමය මෙහෙයුම් අකර්මණ්‍ය කිරීමට අවශ්‍ය නීතිමය මර්දනයන් පෙර නොවූ විරූ තරමින් දියත්ව ඇත්තේද එම ගෝලීය හවුලේ විවෘත හා පූර්ණ පිටුබලයෙනි. පසමිතුරු භූ දේශපාලන අභිලාෂයන් සහිත කලාපීය සහ ගෝලීය පිළිමළුන් එක්තැන් කරන ව්‍යතිරේඛී රාජ්‍යයක් බවට ශ්‍රී ලංකාව පත්කරන්නේ මෙකී යථාර්ථයන් විසිනි. යුද්ධයක ගිලී ගත් ශ්‍රී ලංකාවට සැපයෙන යුදමය නොවන 'සංවර්ධන ආධාරයන්' පිළිබඳව අවසන් වශයෙන් සාකච්ඡා කිරීමට ඉතිරිව ඇති කාරණා විසින් ඉදිරියේදී මෙම යථාර්ථයන් තව දුරටත් සනාථ කරනු ඇත.

බැලූ බැල්මට අභ්‍යන්තර යුද්ධයක් සේ පෙනෙන සිව්වෙනි ඊළම් යුද්ධය වනාහී, තවදුරටත් 'දකුණේ සිංහල කොල්ලන්ගෙන්' සැදුම්ලත් ශ්‍රී ලංකා රජයේ හමුදාවන්ගේ සහ ඊට ප්‍රතිමුඛව සිටගත් දෙමළ ගරිල්ලන්ගේ වීරත්වය හෝ සංග්‍රාම නිපුණතාව පිළිබඳ ලිට්මස් පරීක්ෂාවක් නොවේ. වත්මන් යුද්ධය, ඉන් ඔබ්බෙහි ඇති යථාර්ථයක් උර ගා බැලෙන කලාපීය හා ගෝලීය පර්යේෂණ භූමියක් බවට දැන් පෙරළී තිබේ. මේ තාක් සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලද බොරු කළ නොහැකි දත්තමය කරුණු තුළින් ප්‍රකාශ කෙරෙන ඇත්ත එයයි.

(මතු සම්බන්ධයි)

**රවීස**

*raveesa@googlemail.com*

*රාවය / 2008 ඔක්තෝබර් 26*